# සුබස් සිතිවලි

බැටිකලෝ, චිලව් වැනි නම් ලංකාවේ සාමාන්‍ය මිනිසුන්ට අපබ්‍රංස ය. එය මඩකලපුව, හලාවත බව ලංකාවේ ඉංගිරිසි උගත් මිනිස්සු දනිති. විදේශීකයන් සිතන්නේ-දන්නේ බැටිකලෝ, චිලව් යනුවෙන් නගර දෙකක් ලංකාවේ ඇති බව ය. එදා ඉංගිරිසියා තමා කැමති දෑ කෙලේය. ඔහුට ගුරුහරු කම් දීම අත පුලුස්සා ගැනීමකි. ගෝල්, ටැංගෝල්, ඩොන්ඩ්‍රා, කැන්ඩි ටිකක් අමාරුවෙන් වුවද තේරුම් ගත හැක්කේ එහි සිංහල මුහුනුවර යම් තම් දක්නට ඇති නිසාය.

බොලිවියා, ටැස්මේනියා වැනි රටවල නම් යම් පුද්ගලයකු මුල් වීම නිසා ඇති වූ ඒවා ය. පැපෑන්, ස්වීඩන් වැනි රටවල නම්වල (ජපන් රට) ජපානය, (ස්වීඩන් රට) ස්වීඩනය යනුවෙන් සිංහල මුහුනුවරක් දී අපි භාවිතා කරමු. හල් අකුරකින් අවසන් වන වචන වරනැගීමේ පහසුව සඳහා එසේ කිරීම අවශ්‍ය වේ. ටිබැට් රට ටිබැටය හෝ තිබ්බතය යනුවෙන් හඳුන්වන්නේ ඒ නිසාය. තිබ්බතය තේරුම් ගත හැක්කේ ලංකාවේ සිංහල බාසාව උගත් අයට පමනි. ඉංග්ලීලන්ඩ් හොලීලන්ඩ්, තායිලීලන්ඩ්, අයිස්ලීලන්ඩ්, නිව්සීලීලන්ඩ් යනු ඉංගිරිසි බාසාවේ බිම, රට, දේශය යන අදහස දෙන "ලෑන්ඩ්" එකතු කර හදා ගත් නම් ය.


වි ක ධර්මබන්ධු

අද ලෝකය දෙස බලන විටත්, ජාතීන් අතර බැඳීම් ගැන සිතන විටත් රටක නමක්, නගරයක නමක් ඒ සැටියට ම බාවිතා කිරීමේ පහසුවත් අවශ්‍යතාවත් තේරුම් ගත හැකි ය.

පිලිගත් රටවල් 195 කටත් වැඩියෙන් අද ඇති බව කියති. ඒ රටවලට විවිද හේතු නිසා ඒ නම ලැබී ඇත. නගර, ගම් වලට ද එසේම විවිද හේතු  නිසා ඒ නම ලැබී ඇත. මහජීතොට ම මාතර වී ඇති බවත් ගාල ම ගාල්ල වී ඇති බවත් පස් ගම ම ගම්පහ වී ඇති බවත් අපි දනිමු. චීනයට, ජපානයට මෙන් ම ලංකාවට ඒ නම ලැබුනේ කෙසේ ද යන්න පවා මම නොදනිමි.

ලෑන්ඩ්/ලන්ඩ් යන්න ලන්තය/ලන්දය වී ඇතත් (හොලන්ඩ්-ඕලන්දය වී ඇත) ක්වීන්ස්ලන්ඩ් අයිස්ලන්ඩ්, පෝලන්ඩ්, තායිලන්ඩ් අප ලියන්නේත් කියන්නේත් ක්වීන්ස්ජීලන්තය, අයි-ස්ජීලන්තය, පෝජීලන්තය, තායිජීලන්තය යනුවෙනි. එහි මුල් කොටස වෙනස් නොවේ.

පෝට් හෙඩ්ලන්ඩ්, ඇඩිලේඩ්, බ්‍රිස්බන්, මෙල්බන්, ඩාවින්, පර්ත් යන නම් එලෙස ම බාවිතා කරනු මිස ඒවා වෙනස් කිරීම අවිලකට හේතු වේ. මෙහි ගම් නගර වලට ආදිවාසී (ඈවැසි) නම් ද ඇති බව අපි දනිමු. වොගා වොගා, මැංජිමප්, ජින් ජින්, බැන්ජප් එබඳු නම් කීපයකි

මහනුවර යුගයේ ලියවුනු විල්බා ගෙදර රාලගේ තානාපති ගමන් විස්තරයේ අමසරදමක් ගැන ලියා ඇත. අපි " අමසරදම" නුවරක නමක් බව දනිමු. ඉන් එහා යමක් ගැන නොදනිමු. ඒ " ඇම්ස්ටර්ඩෑම්" විය හැකි බව කියන උගතාගේ මතය අපි පිලිගනිමු. ඕස්ට්‍රේලියාව "කැංගරු රට" නමින් හඳුන්වන නමුත් එය යෙදෙන්නේ සාහිත්‍ය පොත්වල පමනි. පැන්ඩා නම් වලසා නිසා චීනය " පැන්ඩා රට" යනුවෙන් හැඳින්විය හැකිය. එහෙත් එය සාහිත්‍යයට සීමා වේ. පිලිගත් නිලනම වෙනස් නොවී එලෙස ම පවතී.

මතුරට, අලුත් නුවර, මහනුවර, රත්නපුරය, අනුරාධපුරය, මිදිගම, අලුත්ගම යන නම් හැදී ඇත්තේ රට, නුවර, පුරය, ගම අගට යෙදුනු නාම පදයකිනි. අලුත්ජීගම, අලුත්ජීනුවර ආදි වශයෙනි. ඒ අනුව පර්ත්පුරය/නුවර, මෙල්බන්පුරය/නුවර බ්‍රිස්බන්පුරය/නුවර, සිඩ්නිපුරය/නුවර යනුවෙන් වියහර කිරීම වඩා උචිත විය හැකිය.

එද ජැරඑයල දුෙ ජැරඑයල සබ ජැරඑය ලරෙදප ජැරඑය යනු ඉංගිරිසි ක්‍රමය යි. ඉංගිරිසියේ වර නැගීමක් නැත. වර නැගීම සිංහල මගද සකු බාසාවල නීතියයි, ගාල්ල-ගාල්ලට-ගාල්ලේ-ගාල්ලෙන් මෙන් ම බලයි/බලත්; බලහි/බලහු, බලම්/බලමු යනුවෙන් නාම ක්‍රියා-වර නැගේ.

අප කල යුත්තේ නාම පදයට තවත් නාම පදයක් ආදා එය වර නැගීමයි. මලයජීරට, මලයරටට, මලය රටේ, මලයරටින් මෙන් පර්ත්නුවරට පර්ත්නුවරින්, සිඩ්නි නුවරින්,සිඩ්නි නුවරට, ඇඩිලේඩ් නුවරින්, ඇඩිලේඩ් නුවරට යන විදියට ය.

දොඩන බසේ අප වියහර කරන්නේ පර්ත්වල, පර්ත්වලින්, පර්ත්වලට යනුවෙනි.


**සන්නස නව ගිණුම් අංකය**

සන්නස පුවත්පතේ වෙළඳ දැන්වීම් සඳහා ගෙවීම් පහත දැක්වෙන සන්නස නව ගිණුමට ගෙවන්න

Account Name - Sannasa Media
Bank - Commonwealth Bank
BSB Number - 063619
Account Number - 10852409

**සන්නස මීඩියා Sannasa Media**

Looking for professional
**Migration advice ?**

The experts in all Australian visa categories with thousands of successful applications from around the world

Our Services :

**We offer you a number of services, ranging from phone consultation to lodging your migration application and appeals on your behalf. Our core services involve:**

- General Skilled Migration
- Partner Migration
- Business Migration
- Parent Migration
- Visit / Tourist Visas
- Student Visas


**Hemantha Punchihewa**
**MARN 0209063**


**Surani Punchihewa**
**MARN 0426579**

**Australian Address :**
**H&S Associates**
**737 Burwood Road,**
**Hawthorn 3123.**
**Australian Contact Number :**
**00 61 419 373 888**
**E-Mail : contact@hs-associates.com**

**AUSTRALIAN MIGRATION CENTRE**

**Sri Lankan Address :**
**5/6, Railway Avenue, Nugegoda.**
**Tele: 011 281 8 833**
**Fax: 011 281 8 835.**
**E-mail : contact@australianmigrationcentre.com**